දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය
எனது இல.
My No.
PSC/EST/06-05/03
2015

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2024.07.24

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 04/2020(1)

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>නිලධරයාගේ ඉල්ලීම මත පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් දරන නිලධරයකු ජාතික සේවයේ අනුරූපී තනතුරකට අන්තර්ග්‍රහණය කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිකුත් කරන ලද 2020.01.30 දිනැති අංක 04/2020 චක්‍රලේඛයෙහි හා 2024.02.27 දිනැති අංක 01/2024 චක්‍රලේඛ ලිපියෙහි විධිවිධාන ප්‍රකාරව අදාළ බලධරයන් විසින් එතෙක් ගෙන ඇති තීරණවලට හෝ ක්‍රියාමාර්ගවලට අගතියක් නොවන පරිදි, මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින සිට ඉහත කී චක්‍රලේඛය හා චක්‍රලේඛ ලිපිය අවලංගු වේ.

02. ජාතික සේවයේ තනතුරකට අනුරූපී පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන හෙද සේවයේ, වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ, අතුරු වෛද්‍ය සේවයේ හා ගුරු සේවයේ නිලධරයකු, පහත i සිට viii දක්වා අවශ්‍යතා සපුරාලන්නේ නම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභිනියෝජිත බලය දරන අදාළ පත්කිරීම් බලධරයා විසින් එකී නිලධරයාගේ ඉල්ලීම මත ජාතික සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබිය හැකිය.

i. නිලධරයා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z අගය මත හෝ, උපාධිධරයකු නම්, දීපව්‍යාප්ත විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් තෝරාගනු ලැබීමෙන් අනතුරුව පළාත් රාජ්‍ය සේවයට බඳවා ගෙන තිබිය යුතුය.

ii. පළාත් රාජ්‍ය සේවයේ තනතුර දැරීමට අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම සඳහා වූ මූලික පුහුණුව අදාළ රේඛීය අමාත්‍යාංශය යටතේ ලබා තිබිය යුතුය.

iii. ජාතික සේවයේ අනුරූපී සේවා ව්‍යවස්ථාවේ/බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට සමාන විධිවිධාන ඇතුළත් පළාත් රාජ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවකින්/බඳවා ගැනීමේ පටිපාටියකින් පාලනය වන තනතුරක් දැරිය යුතුය.

iv. පළාත් රාජ්‍ය සේවයේ අදාළ තනතුරෙහි පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

v. නිලධරයා කිසියම් හෝ විනය ක්‍රියාමාර්ගයකට යටත්ව නොසිටිය යුතු අතර අදාළ පළාත් බලධරයින් විසින් නිලධරයාට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොතිබිය යුතුය.

vi. පළාත් රාජ්‍ය සේවයේ සේවයට අදාළව නිලධරයාට එරෙහිව කිසිදු අධිකරණ ක්‍රියාමාර්ගයක් ආරම්භව නොතිබිය යුතුය.

vii. නිලධරයා පළාත් රාජ්‍ය සේවයෙන් ස්ථිරව මුදා හැරීමට අදාළ පළාත් පත්කිරීම් බලධරයාගේ එකඟතාව ලැබී තිබිය යුතුය. නිලධරයකු පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට අදාළ නියමයන් හා කොන්දේසි අදාළ පළාත් බලධරයින් විසින් තීරණය කළ යුතුය.

viii. තමන් මෙම චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව ජාතික සේවයේ තනතුර බාරගන්නා බවට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟවන බවට දිවුරුම් ප්‍රකාශයක් නිලධරයා විසින් ජාතික සේවයේ අදාළ පත්කිරීම් බලධරයාට ඉදිරිපත් කළ යුතුය.

03. මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ ජාතික සේවයේ තනතුරකට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධරයකුගේ ජ්‍යෙෂ්ඨතාව, නිලධරයා පළාත් රාජ්‍ය සේවයේ තනතුරට පත්කරනු ලැබූ දිනයේදී ජාතික සේවයේ අදාළ තනතුරට පත්කරනු ලැබ ඇතැයි සලකා තීරණය කළ යුතුය. එසේ වුවද, පහත සඳහන් අවස්ථාවලදී හැර, මෙම චක්‍රලේඛයේ විධිවිධාන යටතේ ජාතික සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති නිලධරයකු ජ්‍යෙෂ්ඨතාව නිර්ණායකයක් වන තෝරා ගැනීමකින් සිදු කරනු ලබන උසස් කිරීමක් සඳහා අන්තර්ග්‍රහණයෙන් වසර තුනක් (03) ඉකුත් වන තුරු සුදුසුකම් නොලබන්නේය.

i. උසස් කිරීම සඳහා සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ ප්‍රමාණවත් නිලධරයන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති අවස්ථාවකදී

ii. පළාත් රාජ්‍ය සේවයේ පෙර තනතුර දරමින් සිටියේ නම් වුවද අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නා වූ උසස් කිරීම්

04. පළාත් රාජ්‍ය සේවයෙන් ජාතික සේවයට අන්තර්ග්‍රහණය වීමට ඉදිරිපත් වන සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන්ම අදාළ පත්කිරීම් බලධරයින් අන්‍යෝන්‍ය එකඟතාවයක් අනුව කටයුතු කළ යුතුය.

05. මෙම චක්‍රලේඛ විධිවිධාන යටතේ ජාතික සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන සෑම නිලධරයකුටම ජාතික සේවයේ අදාළ පත්කිරීම් බලධරයා විසින් නව පත්කිරීම පාලනය වන නියමයන් හා කොන්දේසි ඇතුළත් තනතුරට අන්තර්ග්‍රහණය කිරීමේ ලිපියක් නිකුත් කළ යුතුය. මේ සඳහා පත්කිරීම් බලධරයින් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 3 වැනි පරිශිෂ්ටයේ දැක්වෙන ආදර්ශ පත්කිරීම් ලිපිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව භාවිතා කළ යුතුය.

මෙම චක්‍රලේඛය 2024.07.24 දින සිට ක්‍රියාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

Ndayal

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ.දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව